# <u>ලංසු කැඳවීමේ විස්තර පත්‍රිකාව</u>

## ජාතික ගමනාගමන කොමිෂන් සභාව

## නො 241, උද්‍යාන පාර, කොළඹ 05

ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ පහත අයිතමයන් විකිණීම සඳහා ටෙන්ඩර් මිල ගණන් කැඳවනු ලැබේ.

| අනු අංකය | අයිතමය | පරික්ෂා කළ හැකි ස්ථානය | ස්ථානීය පරීක්ෂාවේදී සම්බන්ධ කර ගත හැකි නිලධාරීන් |
|---|---|---|---|
| 01 | ජෙනරේටරය | ජාතික ගමනාගමන කොමිෂන් සභාව නො 241, උද්‍යාන පාර, කොළඹ 05 | ඉන්දිකා ලක්මාලි මිය ( ගබඩා අංශය ) දු.ක. – 011-2587372 නිසංසලා ජයවර්ධන මිය ( ගබඩා අංශය ) |
| 02 | LED පැනල මොඩියුල්ස් | ජාතික ගමනාගමන කොමිෂන් සභාව බැස්ටියන් මාවත බස් පර්යන්ත කාර්යාලය | පී.ඒල්.ඒස්.ටී. ප්‍රියංකර මහතා බැස්ටියන් මාවත කාර්යාලය දු.ක. – 011-2333222 |
| 03 | අබිලි යකඩ | ජාතික ගමනාගමන කොමිෂන් සභාව බැස්ටියන් මාවත බස් පර්යන්ත කාර්යාලය | |

01. මෙම අයිතමයන් 2026.03.11 සිට 2026.03.25 දින දහවල් 12.00 දක්වා දිනයන්හිදී කාර්යාල රාජකාරී සිදුකරනු ලබන දිනවලදී පෙ.ව. 10.00 සිට ප.ව. 03.00 දක්වා අදාල ස්ථානයන්හිදී පරීක්ෂා කළ හැකිය.
02. මෙම අයිතම 03 සඳහා වෙන වෙනම මිල ගණන් මේ සමග ලබාදී ඇති අයදුම්පත්‍රය භාවිතා කර ඒයට අනුකූලව මුද්‍රා තැබූ කවරයක බහා පහත විස්තර කර ඇති පරිදි ඉදිරිපත් කළ යුතුය.
03. මෙම ටෙන්ඩර් මිල ගණන් ඉදිරි පත් කිරීමේ දී ආපසු ගෙවනු ලබන රු 10,000.00 තැන්පතු මුදලක් ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ තැන්පත් කළ යුතු අතර, මේ සඳහා අයදුම්පත් ජාතික

ගමනගමන කොමිෂන් සභා ප්‍රධාන කාර්යාලයේ ගබඩා අංශය මගින් සතියේ වැඩ කරන දින වලදී 2026.0311 දින සිට 2026.03.25 දින දක්වා දහවල්12.00 පැය දක්වා ලබා ගත හැකිය.

04. ලංසු බහා ලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉහත දක්වා ඇති අනු අංකය හා අයිතමය සඳහන් කළ යුතුය. ( උදා - අනු අංකය 01 ( ජෙනරේටරය ) )

05. ලංසු භාර ගැනීම 2026.03.25.දින ප.ව. 02.00 ට අවසන් කෙරෙන අතර, ඉන්පසු ලැබෙන ලංසු භාරගනු නොලැබේ. අදාල මිල ගණන් දක්වා ඇති ලංසු නියමිත වේලාවට ප්‍රථම ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ප්‍රසම්පාදන අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කළ යුතුය.

06. 2026.03.25 දින ප.ව. 02.00 ට ප්‍රසම්පාදන අංශය, ජාතික ගමනාගමන කොමිෂන් සභාව, නො 241, උද්‍යාන පාර, කොළඹ 05 ස්ථානයේ ලංසු විවෘත කරනු ලබන අතර මෙම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකුට සහභාගීවීමට හැකිය.

07. ටෙන්ඩර් ක්‍රියාවලිය මත පැන නගින ඕනෑම ගැටලුකාරී තත්වයකදී අදාල අවසන් තිරණය නිර්දේශ කිරීමේ බලය ජාතික ගමනාගමන කොමිෂන් සභාවේ ටෙන්ඩර් කමිටුව සතු අතර, අවශ්‍යතාවය මත අදාල අනුමැතියට කමිටුව මගින් යොමු කරනු ලැබේ.

08. මේ සඳහා ටෙන්ඩර් කරුවන් විසින් දරනු ලබන කිසිදු වියදමක් ( නැවත ගෙවනු ලබන තැන්පත් මුදල හැර ) ප්‍රතිපූර්ණය කිරිමට හෝ ලබාදීමට ජාතික ගමනාගමන කොමිෂන් සභාව බැඳී නොමැති බව දැනුම් දෙන අතර සුදුසුකම් නොලැබූ ලංසුකරුවන් වෙත සති 02 ක කාලයක් තුල තැන්පත් මුදල් ලබා දෙනු ලැබේ.තැන්පත් මුදල නැවත ලබා ගැනීම සඳහා ලිඛිත ඉල්ලීමක් මුදල් තැන්පත් කරන ලද රිසිට්පත සමග ගබඩා නිලධාරී ජාතික ගමනාගමන කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ යුතුවේ.

සභාපති

ජාතික ගමනාගමන කොමිෂන් සභාව

2026.03.06